**කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

*දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*

**වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2022

මාර්තු - 2025

**BMGT E3015 - උපායශීලී කළමනාකරණය**

ප්‍රශ්න සංඛ්‍යාව : හයයි (06) කාලය : පැය 03 යි

ප්‍රශ්න **පහකට (05)** පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න අංක 01**

ඇ) උපායශීලී කළමනාකරණයේ තීරණ ගැනීමේ මට්ටම් (Decision Making Levles) පැහැදිලි කරන්න.

(ලකුණු 04 යි)

ආ) උපායශීලී කළමනාකරණයේ වාසි මොනවාද? සාකච්ඡා කරන්න.

(ලකුණු 06 යි)

ඇ) සමහර ආයතන උපායශීලී කළමනාකරණය සමඟ සම්බන්ධ නොවන්නේ ඇයි? පැහැදිලි කරන්න.

(ලකුණු 06 යි)

ඈ) උපායශීලී කළමනාකරණයට ඔබ විසින්ම ගොඩනඟන ලද නිර්වචනයක් ලබාදෙන්න.

(ලකුණු 04 යි)

**(මුළු ලකුණු 20 යි)**

**ප්‍රශ්න අංක 02**

අ) අභ්‍යන්තර පරිසර විශ්ලේෂණය සංවිධානීය තීරණ ගැනීමට බලපාන්නේ කෙසේද?

(ලකුණු 06 යි)

ආ) VRIO මානකයේ මූලීක සංරචක හඳුනාගෙන එමගින් තරගකාරී වාසි ලබා ගන්නේ කෙසේද යන්න විස්තර කරන්න.

(ලකුණු 06 යි)

ඇ) සංවිධානීය සංස්කෘතිය (culture) සංවිධානයන් අතර වෙනස් වන්නේ කෙසේද?

(ලකුණු 08 යි)

**(මුළු ලකුණු 20 යි)**

**ප්‍රශ්න අංක 03**

අ) බාහිර පාරිසරික සාධක සංවිධානයෙන් නිතර වෙනස් වෙමින් පවතී. සවිස්තරාත්මක උදාහරණයන් සමඟ වෙනස්වීම්වලට හේතු විස්තර කරන්න.

(ලකුණු 08 යි)

ආ) ආහාර කර්මාන්තයේ නව සමාගම්වලට පිවිසුම් බාධක (entry barriers) බලපෑම් කරන්නේ කෙසේද?

(ලකුණු 04 යි)

ඇ) ප්‍රතිලාභදායීන් (Stakeholders) සෑමවිටම සංවිධානවලින් වැඩි ප්‍රතිලාභයක් අපේක්ෂා කිරීමට උත්සාහ කරයි. එම හේතුව කුමක්ද?

(ලකුණු 08 යි)

**(මුළු ලකුණු 20 යි)**

**ප්‍රශ්න අංක 04**

අ) පසුගාමී ඒකාබද්ධ කිරීමේ උපායමාර්ගයේ වාසි අවාසි මොනවාද?

(ලකුණු 05 යි)

ආ) ආයතන තිරස් ඒකාබද්ධ කිරීම (Horizontal Integration) උපායන් සඳහා උදාහරණ කිහිපයක් සඳහන් කරන්න.

(ලකුණු 05 යි)

ඇ) ව්‍යාපාර මට්ටමේ උපායමාර්ග අතරින්, උපායමාර්ගික සන්ධානගත කිරීමේ (Strategic Alliances) උපාය යනු වැදගත් සමූහ උපායමාර්ගයකි. මෙය සුදුසු උදාහරණ සමඟ සරලව විස්තර කරන්න.

(ලකුණු 10 යි)

**(මුළු ලකුණු 20 යි)**

**ප්‍රශ්න අංක 05**

අ) ක්‍රියාකාරී හෙවත් ශ්‍රිතික කළමනාකරුවන් සංයුක්ත උපායමාර්ග ක්‍රියාවට නැංවීමට සහාය දක්වන්නේ කෙසේද? විස්තර කරන්න.

(ලකුණු 08 යි)

ආ) ආයතන විසින් විවිධාංගීකරණ උපායමාර්ග ක්‍රියාවට නැංවීමේදී, වැඩිම ප්‍රතිලාභ ඇති විවිධාංගීකරණ උපායමාර්ගය කුමක් විය හැකිද? ඔබේ පිළිතුර සැබෑ ව්‍යාපාරික ලෝකයේ උදාහරණ සමඟ විස්තර කරන්න.

(ලකුණු 12 යි)

**(මුළු ලකුණු 20 යි)**

**ප්‍රශ්න අංක 06**

අ) කළමනාකරුවන්ගේ සහය නොමැතිව උපායන් ක්‍රියාවන්ට නැංවීම සැමවිටම අසාර්ථක වේ. මෙය උදාහරණ මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 07 යි)

ආ) උපායයන් සම්බන්ධයෙන් වන BCG ආකෘතිය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08 යි)

ඇ) මයිකල් පෝටර්ගේ පංච බල ආකෘතියේ මූලිකාංග පෙන්වා දෙන්න.

(ලකුණු 05 යි)

**(මුළු ලකුණු 20 යි)**